**සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදල - 2018**

**--------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වා ගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට රු.408,998 ක්වූ උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණි. | තොරතුරු ලබා ගැනීමේ දී සිදු වී ඇති අතපසුවීමක් නිසා උපචිත වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය තොග ලෙජර ශේෂය රු.54,843,092 ක් වූ අතර එදිනට භෞතික තොග ශේෂය රු.62,814,047 ක් විය. වෙනස රු.7,970,955 ක් සඳහා හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකරනු වෙනුවට එම අගය ලිපිද්‍රව්‍ය අලෙවි ආදායමක් ලෙස සලකා ගිණුම් ගතකර තිබුණි. | සමාලෝචන වර්ෂයේ ඇතැම් අවස්ථාවල පෙර ඇණවුම් මිල මත පදනම් කරගෙන පසුව තොගයන් නිකුත් කිරීම හා වර්ෂ අවසාන ඉතිරිය පෙර ඇණවුම් මිල මත ගණනය කිරීම මත භෞතික ශේෂ ගණනයේදී වටිනාකම් අතර නොගැලපීමක් නිර්මාණය වී ඇත. එය නිරීක්ෂණය වීමෙන් අනතුරුව ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් ක්‍රමයට(FIFO) ලිපි ද්‍රව්‍ය නිකුත් කිරීමට උපදෙස් දී ඇත. තවද ලිපි ද්‍රව්‍ය 1000/5000/10000 වශයෙන් සකස් කර මුද්‍රණාල වලින් භාර දී ඇති මුද්‍රිත අණවුම් පර්සල් ගලවා අවශ්‍යතාවයන් මත දිස්ත්‍රික් වෙත නිකුත් කිරීමේදී එම පාර්සල් තුල ගණනය වන අතිරික්ත ප්‍රමාණයන්ද මෙසේ සමාලෝචිත වර්ෂයේ තොග ශේෂය හා භෞතික ශේෂය අතර වෙනසකට හේතු වී ඇත.එබැවින් එම වෙනස ආදායමට ගැලපුම් කර ඇත. | ලිපිද්‍රව්‍ය තොග ලෙජර ශේෂය හා භෞතික තොගය කාලීනව සැසඳීම් කලයුතුයි. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

රු. 3,914,166 ක් වූ තොග හා කාර්යාල උපකරණ සම්බන්ධයෙන් සමීක්ෂණ වාර්තා විගණනය ඉදිරිපත් නොවිය.

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව<br>---------------- | අනුකූල නොවීම<br>------------------ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>------------------ | නිර්දේශය<br>----------- |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 486 | 2018 දෙසැම්බර් මස 31 දිනට මාස 04 සිට මාස 20 දක්වා කාලයක් ගතවී තිබුණු තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ එකතුව රු. 614,487 ක් වූ චෙක්පත් 18 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිරවුල් කර දෙන මෙන් බැංකුව දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) | මුදල් රෙගුලාසි 876 (3) | ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වා ගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කළයුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. | 2013 අංක 1 දරණ දිවි නැගුම පනත අනුව දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහනය වූ අදිකාරී 03 හි ක්‍රියාත්මක කරන ලද අරමුදල් 45 වගන්තිය ප්‍රකාරව ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. ඒ අනුව දිවි නැගුම පනතට අනුව ලිපි ද්‍රව්‍ය චක්‍රිය අරමුදල පවත්වාගෙන යාමට දිවි නැගුම පණතින් පර්ලිමේන්තුවේද අනුමැතිය ලැබී ඇත. 2013 අංක 01 දරන දිවි නැගුම පනතේ අංක 45 ප්‍රකාරව මෙම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලකි. මෙම අරමුදල පවත්වාගෙන යාමට අවශ්‍ය නීති රෙගුලාසිමාලා සකස් කර නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. | අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කළයුතුයි. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාන මාර්ගෝපදේශ සංග්‍රහය<br>(i) 4.2.1 මාර්ගෝපදේශය | අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර මාස 6 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා | ලිපි ද්‍රව්‍ය සඳහා අවශ්‍ය වටිනාකම් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර ඇති මුත් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.ඉදිරියේදී කටයුතු කිරීම සඳහා සටහන් කර ගන්නා ලදී. | මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර රු.83,679,825 ක ලිපිද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. | | |
| (ii) | 5.4.11 මාර්ගෝපදේශය | එකතු කළ අගය මත බදු ගෙවිය යුතු වන පුද්ගලික මුද්‍රණ ආයතනයකින් අවස්ථා 10 කදී එකතුව රු.18,513,750 ක් වූ බැංකු ලිපිද්‍රව්‍ය මුද්‍රණ කටයුතු සිදුකර ගෙන තිබුණු නමුත් එම සැපයුම්කරු වෙතින් බදු ඉන්වොයිස් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මිල යෝජනා ලබා ගැනීමේදී වැට් බදු ඉල්ලා නොමැතිනම් වැට් බදු ගෙවීම් නොකරන අතර ඉන්වොයිස් ඉදිරිපත් කිරීමේදීද වැට් අගයන් සටහන් කර නොමැති බැවින් මෙම ආයතනය සඳහා වැට් බදු ගෙවීම් නොකරන ලදී. | ආයතනය වැට් බදු ගෙවා ඇති බැවින් බදු ඉන්වොයිස් ලබා ගැනීමට කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 15,908,082 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු16,507,651 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.599,569 පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මුළු වියදම් රු 1,236,049 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය<br>----------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>---------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය මුද්‍රණය කිරිම වෙනුවෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 21,269,895 ක් වර්ෂ 3 කට අධික කාලයක් ගත වී ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට වරින් වර දැනුවත් කර ඇතත් ඊට අදාල ඉන්වොයිසි මේ වනතෙක් ලැබී නොමැත. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය<br>------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>----------------- | නිර්දේශය<br>--------- |
|---|---|---|
| මුදල් රෙගුලාසි 877(2)(ඇ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී මාස 02 ක් තුළ මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වර්ෂ 03 කට අධික කාල ප්‍රමාදයක් සහිතව 2022 | 2014 වර්ෂයේ සිට දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතට පත් වූ ලිපි ද්‍රව්‍ය චක්‍රිය අරමුදලේ2014/2015/2016 හා 2017 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන මීට පෙර එකවර විගණනය සඳහා | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

| | |
|---|---|
| මැයි 17 දින ඉදිරිපත් කර තිබුණි. | ඉදිරිපත් කර ඇත. නමුත් මූල්‍ය ප්‍රකාශන වර්ෂයෙන් වර්ෂය විගණනය කිරීමෙන් පසු ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. ඒ අනුව කටයුතු කර ඇත. |

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය<br>-------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>----------------------- | නිර්දේශය<br>-------- |
|---|---|---|
| මුදල් රෙගුලාසි 877(1) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කර 2021 වර්ෂයේ සිට ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ලේඛනය සකස් කර ඉදිරිපත් කළ යුතුය. |